www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## ලියොන් ට්‍රොට්ස්කි හා ඓතිහාසික මුසාකරනයේ පශ්චාත් සෝවියට් ගුරුකුලය

# ජෙෆ්රි ස්වේන් හා ඉයන් ඩී. තැචර් විසින් රචිත ට්‍රොට්ස්කි ජීවන චරිත ද්වය පිලිබඳ ව විවරනයක්

## පලමු කොටස:ස්ටැලින් භීෂනය පිලිබඳ වසරෙන් හැත්තෑ වසරකට පසු ව

**Leon Trotsky and the post-Soviet school of historical falsification**
**A review of two Trotsky biographies by Geoffrey Swain and Ian Thatcher- Part 1**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2007 මැයි 9**

*මෙහි පලවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සභාපති වූ ද සමාජවාදී සමානතා පක්ෂයේ (ඇමරිකා එක්සත් ජනපද) ජාතික ලේකම් වූ ද ඩේවිඩ් නෝර්ත් විසින් මහාචාර්ය ජෙෆ්රි ස්වේන් සහ මහාචාර්ය ඉයන් ඩී. තැචර් යන ශාස්ත්‍රාලිකයින් දෙදෙනා ලියූ ලියොන් ට්‍රොට්ස්කිගේ චරිතාපදාන දෙකක් ගැන කරන ලද කොටස් හතරකින් යුත් විවරනයක පලමු කොටසයි.*

ට්‍රොට්ස්කි, ජෙෆ්රි ස්වේන් විසිනි. පිටු 248, ලෝන්ග්මන්, 2006.
ට්‍රොට්ස්කි, ඉයන් ඩී. තැචර් විසිනි. පිටු 288, රූට්ලෙජ්, 2003.

සෝවියට් සංගමයේ ඉතිහාසයෙහි වඩාත් ම බිහිසුනු වසර පිලිබඳ 70 වන සංවත්සරය මෙම වසරින් සනිටුහන් වෙයි. ලිව් කමනෙව්, ග්‍රෙගරි සිනොවියෙව්, ඉවාන් ස්මිර්නොව් ඇතුලු ඔක්තෝබර් විප්ලවයේ සෙසු නායකයන් ඝාතනය කිරීම ආවරනය කරනු පිනිස 1936 අගෝස්තුවෙහි, මොස්කව් හි දී දේශපාලනික නඩුවක් මවා පෑමෙන් අනතුරුව 1937හි දී ස්ටැලින් භීෂනමය උද්ඝෝෂනයක් දියත් කලේ ය. එහි අරමුන වූයේ සෝවියට් සංගමය තුල මාක්ස්වාදී දේශපාලනික චින්තනයෙන් හා සංස්කෘතියෙන් ශේෂ ව පැවති සියල්ල ම විනාශ කර දැමීම ය. භීෂනය, 1917 ඔක්තෝබර් විප්ලවයෙහි සැලකිය යුතු කාර්යභාරයක් ඉෂ්ට කල සියල්ලන්ම වාගේ, නො එසේ නම්, තම ජීවන වෘත්තීන්හි කිසියම් හෝ අවස්ථාවක ස්ටැලින්වාදී රාජ්‍යයට මාක්ස්වාදී හා සමාජවාදී විරෝධය පෑමෙහි රූපාකාරයන් හා අනන්‍ය වූවන් එසේ නැති නම් පුද්ගලික ව හෝ තම සහෝදරයන්, මිතුරන් හෝ පවුල මගින් මාක්ස්වාදී දේශපාලනික, බුද්ධිමය හා සංස්කෘතික වාතාවරනය හා සම්බන්ධ වූවන් ගොදුරු කර ගැනුම තම එල්ලය කර ගත්තේ ය.

70 වසරක් ඇවෑමෙන් පවා 1937-38 කාල පරිච්ඡේදයෙහි ස්ටැලින්වාදී රාජ්‍යය විසින් මරා දමනු ලැබුනු පුද්ගලයන් සංඛ්‍යාව පරිසමාප්ත වශයෙන් තහවුරු කෙරී නැත. ඇම්ස්ටර්ඩෑම් විශ්වවිද්‍යාලයෙහි මහාචාර්ය මයිකල් එල්මන් ලග දී කල විශ්ලේෂනයකට අනුව 1937-38 මර්දනකාරී ඝාතනයන් පිලිබඳ ව දැනට කල හැකි හොඳ ම තක්සේරුව 950,000 - මිලියන 1.2 (මිලියනයක්) පමන වන්නේ ය. විසි වන සියවසෙහි රුසියානු හා ලෝක ඉතිහාසය පිලිබඳ ව සැලකිලිමත් වන්නවුන් එනම්, ඉතිහාසඥයන්, ගුරුවරුන් හා පුවත්පත් කලාවේදීන් විසින් උපයෝග කර ගත යුතු වන තක්සේරුව මෙය වන්නේ ය.[1] අලුත් සාක්ෂ්‍ය අනාවරනය කර ගැනුමේ හේතුවෙන් කිසියම් අවස්ථාවක මෙකී සංඛ්‍යාව සංශෝධනය කිරීමට අවශ්‍ය වනු ඇතැයි එල්මන් සඳහන් කරයි.

ස්ටැලින්, දේශපාලන කමිටුව තුල හා එන්.කේ.වී.ඩී.ය තුල ඔහුගේ හෙන්චයියලා විසින් සංවිධානකොට ක්‍රියාත්මක කෙරුනු මහා ජන ඝාතන ව්‍යාපාරය පිලිබඳ ව සවිස්තර චිත්‍රයක් සම්පාදනය කරන පුරා විද්‍යාත්මක සාක්ෂ්‍ය දැන් සැලකිය යුතු තරම් පවතී. සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ (සෝසසසං) ශ්‍රේෂ්ඨාධිකරනයෙහි මිලිටරි අධ්‍යාපන ආයතනය, නීතිය මගින් යුක්ති යුක්ත කෙරුනු මහා ජන ඝාතන සන්තතියෙහි ප්‍රධාන කාර්ය භාරයක් ඉෂ්ට කලේ ය. මොස්කව්හි පැවැත්වුනු ප්‍රසිද්ධ මවාපෑමේ නඩු විභාග තුනෙහි දී සම්පූර්න වශයෙන් ගත් කල්හි විත්තිකරුවන් පනස් හතර දෙනෙකුට එරෙහි ව නඩු තීන්දු දෙනු ලැබින. එහෙත් මිලිටරි අධ්‍යාපන ආයතනය විසින් දස දහස් ගනන් ජනතාවන් දොරවල් වසා ගෙන විනිශ්චය කෙරින. ඔවුන්ට එරෙහි ව මරන තීන්දුව දෙනු ලැබුනේ සාමාන්‍ය වශයෙන් ගත් කල්හි මිනිත්තු 10ත් 15ත් අතර කාලයක් තුල සම්පූර්න කෙරුනු 'නඩු විභාගවලට' පසු ව ය.[2] ගොදුරු කර ගනු ලැබුනේ, එන්.කේ.වී.ඩී.ය විසින් සම්පාදිත ලැයිස්තුවල නම්

සඳහන් පුද්ගලයන් ය. එම ලැයිස්තුවල යෝජිත දඬුවමක් ද සඳහන් කෙරී තිබුනි. මෙම ලැයිස්තු ස්ටැලින්ගේ හා දේශපාලන මන්ඩලයේ නිරීක්ෂනය සඳහා ඉදිරිපත් කෙරුනි. නම් කෙරී තිබුනේ පක්ෂයේ, සෝවියට් සභාවල, කොම්සොමොල්වල (Komsomol ), වෘත්තිය සමිතිවල, රතු හමුදාවේ හා එන්.කේ.වී.ඩී. නිලධාරීන් යන නායකත්වය උසුලන පුද්ගලයන් හා ලේඛකයන් කලාකරුවන් හා ආර්ථික ආයතනවල කැපී පෙනෙන නියෝජිතයන් ය. මොවුන් අත්අඩංගුවට ගත්තේ එම එන්.කේ.වී.ඩී.යේ නිලධාරින්ම ය.[3] ස්ටැලින් හා ඔහුගේ දේශපාලන මන්ඩලය මෙම ලයිස්තු නිරීක්ෂනය කොට සෑම අවස්ථාවක ම වාගේ යෝජිත දඬයම් අනුමත කලේ ය - බෙහෙවින් යෝජනා කෙරී තිබුනේ වෙඩි තබා මරා දැමීමට ය. මොස්කව්හි ජනාධිපති පුරා විද්‍යායතනයෙහි ස්ටැලින්ට 1937 පෙබරවාරි හා 1938 සැප්තැම්බර් අතරෙහි ඉදිරිපත් කෙරුනු ලැයිස්තු 383ක් ඇත. මේවායෙහි පුද්ගලයන් 44,500ක නම් ටයිප් කෙරී තිබේ. මෙම ලැයිස්තුවල පැන්සලෙන් ලියන ලද සටහන් හා ස්ටැලින්ගේ හා ඔහුගේ සගයන්ගේ අත්සන් ද අන්තර්ගත වෙයි. [4]

1937හි දී මිලිටරි අධ්‍යාපන ආයතනය නඩු තීන්දු 14,732ක් දුන්නේ ය. 1938හි දී තවත් නඩු තීන්දු 24,435ක් දෙනු ලැබුනි. භීෂනයෙහි ප්‍රධාන අධ්‍යක්ෂකවරයා වූයේ ස්ටැලින් ය. ඔහු භීෂනයෙහි දෛනික ක්‍රියාකාරීත්වයන්හි ගැඹුරින් ආසක්ත ව සිටියේ ය. 1938 සැප්තැම්බර් 12 වෙනි දා එක ම එක දිනයක් තුල ස්ටැලින් මරන දඬුවම් 3167ක් අනුමත කලේ ය. එම අනුමැතිය ක්‍රියාත්මක කරනු පිනිස මිලිටරි අධ්‍යාපන ආයතනයට පවරනු ලැබින.[5] මිලිටරි අධ්‍යාපන ආයතනය තම වැඩ කර ගෙන ගිය ආකාරය පිලිබඳ ව සෑහෙන තරම් තොරතුරු තිබේ. එහි රහසිගත නඩු සාමාන්‍යයෙන් විභාග කරනු ලැබුනේ මොස්කව්හි ලෙෆෝටෝවෝ සිර ගෙදර දී ය. ක්‍රියාකාරිත්වයෙහි භාරකාරත්වය ප්‍රධාන වශයෙන් උසුලනු ලැබුනේ වසිලි උල්රික් විසිනි. ඔහු අධ්‍යාපන ආයතනයෙහි සභාපති ය. වැඩ බහුල දිනයක අධ්‍යාපන ආයතනයට 30ක් හෝ ඊට වැඩි ගනනක් නඩු අසන්නට හැකි විය. සිරකරුවන්ගේ තදබදය මග හරවා ගැනුමට අතිරේක අධ්‍යාපන ආයතන නඩු ශාලා ඇටවීමට බොහෝවිට අවශ්‍ය විය. සාමාන්‍ය ක්‍රියා පටිපාටිය වූයේ සිරකරුවන් අධ්‍යාපන ආයතනය හමුවට පැමිනවීම යි. එහි දී චූදිතයාට චෝදනාව කියවනු ලැබේ. චූදිතයාගෙන් අපේක්ෂා කෙරුනේ පූර්වයෙන් 'පරීක්ෂනයෙහි' දී ඔහු විසින් කරනු ලැබුනු ප්‍රකාශය පිලිගැනුම පමනි. විත්තිකරු එකඟතාව පල කලත් නොඑකඟතාව පල කලත් නඩු විභාගය එතැනින් නිමාවට පත් කෙරුනි. එබඳු නඩු පහක් ඇසීමෙන් අනතුරුව අධ්‍යාපන ආයතනය නඩු ශාලාවෙන් බැහැර වූයේ තම තීන්දු සලකා බැලීමට ය. එම තීන්දු ඒ වන විටත් තීන්දු කොට ලේඛන ගත කෙරී තිබුනි. අනතුරුව විත්තිකරුවන් යලි කැඳවනු ලැබුනේ ඔවුන්ගේ ඉරනම දැන ගනු පිනිස ය. සැමවිටම වාගේ එම ඉරනම මරන දන්ඩනය විය. සාමාන්‍යයෙන් නඩු තීන්දුව එදින ම ක්‍රියාත්මක කෙරුනි. [6]

අධ්‍යාපන ආයතන සාමාජිකයන් හට මෙය බරපතල වැඩක් විය. දිගින්දිගට ම මෙම ක්‍රියා පටිපාටිය කර ගෙන යාම පිනිස ඔවුන්ට සෑහෙන පෝෂනයක් අවශ්‍ය විය. ඔවුන් තම ආහාර ගනු සඳහා සාකච්ඡා කාමරයට පිවිසියහ. ලෙෆෝටෝවෝ බන්ධනාගාර නිලධාරියෙකුගේ විස්තරයට අනුව 'මෙම ආහාර වේල ශීත කල විවිධාකාර බොජුන්වලින් - ඒ අතර නොයෙක් වර්ගවල සොසේජස් ද විය - චීස්, බටර්, කලු කැවියාර්, පේස්ට්‍රීස්, චොකලට්, පලතුරු හා පලතුරු යුෂවලින් ද සමන්විත විය.' යූල්රික් කෑම බඩට සෝඩා හැරියේ බ්‍රැන්ඩි පානය කිරීමෙනි.[7]

අධ්‍යාපන ආයතනයේ සාමාජිකයන් හුදෙක් නඩු තීන්දු දුන්නා පමනක් නො වේ. බොහෝ විට ඔවුහු අදාල ස්ථානවලට ගොස් නඩු තීන්දු ක්‍රියාත්මක කිරීම පවා සිද්ධ කලහ. යූල්රික් ඇතැම් අවස්ථාවල ගෙදර පැමිනියේ කබායෙහි තැවරුනු ලේ පැල්ලම් ඇති ව ය.

මොස්කව්, රහස් නඩු විභාග පැවැත්වුනු එක ම නගරය ද නො වීය. ඊට සමාන්තර ව සෝවියට් සමාජවාදී සමූහාන්ඩුව පුරා මෙම ක්‍රියා පටිපාටිය සිද්ධ කෙරුනි. ඔක්තෝබර් විප්ලවය හා සෝවියට් සංගමය නිර්මානය කිරීමට බුද්ධිමය පදනම් දැමූ මාක්ස්වාදයේ හා සමාජවාදී සංස්කෘතියේ සියලුම නියෝජිතයන් වාගේ ස්ටැලින්වාදී පාලන තන්ත්‍රය විසින් ඝාතනය කෙරෙන තුරු භීෂනය පසු බා නො ගියේ ය. මහා ඝාතනය කරන කොට ගෙන සෝවියට් සමාජය දැඩි මානසික ආතතියකට බඳුන් විය. රුසියානු මාක්ස්වාදී ඉතිහාසධර වාඩිම් රොගොවින් පැවසූ පරිදි:

> "ඝාතනය කරනු ලැබූ බොල්ෂෙවික් නායකයන්ගේ භාර්යාවන්, දරුවන් හා සමීපතම සගයන් ඝාතනය කෙරුනු තාක් දුරට එම නායකයන් වටා දැවී ගිය මුඩු බිමක් නිර්මානය කෙරින. ස්ටැලින්වාදී භීෂනය විසින් ජනනය කෙරුනු භීතිය සෝවියට් ජනතාවන් පරම්පරා කිහිපයක විඥානයෙහි හා හැසිරීමෙහි තම ලකුන ශේෂ කලේ ය එය බොහෝ දෙනෙකු කෙරෙන්; අවංක දෘෂ්ටිවාදීමය චින්තනයේ නිරත වීමට ඇති සූදානම, කැමැත්ත හා ශක්තිය අකමකා දැමුවේ ය. ඒ අතර ස්ටැලින්ගේ කාලාවධියෙන් අනතුරුව වන ඝාතකයෝ හා චරපුරුෂයෝ දිගින් දිගට ම වැජඹුනහ. ඔවුහු

හොර නඩු ඇටවීම්, පිටුවහල් කිරීම් වධ දීම් යනාදියට ක්‍රියාකාරී ව සහභාගි වීමෙන් තමන්ගේ ම සුභ සිද්ධියත් තම දරුවන්ගේ සෞභාග්‍යයත් සාක්ෂාත් කර ගත්හ."[8]

ස්ටැලින්ගේ අපරාධ යුක්ති යුක්ත කෙරුනේ නිලධාරිවාදී ඒකාධිපති පාලනයෙහි මාක්ස්වාදී විරුද්ධවාදීන් හා ගොදුරු - සියල්ලට මත් වඩා ලියොන් ට්‍රොට්ස්කි - කඩාකප්පල්කාරයින්, ත්‍රස්තවාදීන් හා විවිධ අධිරාජ්‍යවාදී බලයන්හි - සියල්ලටමත් වඩා ෆැසිස්ට් බලයන්හි - ඒජන්තයන් හැටියට නිරූපනය කල විරූපී මුසාවාදවල පදනම මත ය. එහෙත් ට්‍රොට්ස්කි හා අනෙක් පැරනි බොල්ෂෙවිකයන්ට ඇටවනු හොර නඩු වල පදනම සැකසූ මුසාවාද සූදානම් කෙරුනේ වසර 15කට පූර්වයෙහි සිට ය. ඒවා 1922හි දී ස්ටැලින් සහ ඔහුගේ ආත්ම නාශක සගයන් දෙදෙනා වූ කමනෙව් හා සිනොවියෙව් විසින් ආරම්භකත්වය දෙනු ලැබුනු ට්‍රොට්ස්කි විරෝධී උද්ඝෝෂනය තෙක් ආපස්සට දිවෙයි.

ප්‍රථම මොස්කව් නඩු දෙකෙන් අනතුරුව ට්‍රොට්ස්කි පැහැදිලි කල පරිදි 1936 අගෝස්තු ක්‍රියා දාමය පසුපසින් 1937 ජනවාරියේ පැවැත්වුනු දෙවන හොර නඩුව පැමිනියේ ය. හොර නඩුවේ මූලාශ්‍ර පැවතියේ 'ට්‍රොට්ස්කිවාදයට' විරුද්ධ දේශපාලන අරගලය සඳහා අවශ්‍ය කෙරුනු, ඓතිහාසික වාර්තාව විකෘති කිරීම තුල ය; 'ට්‍රොට්ස්කිවාදය' යැයි නම් කෙරුනේ ස්ටැලින් විසින් නායකත්වය සැපයුනු නිලධාරිවාදී පාලන තන්ත්‍රයට එරෙහි ව පැන නැගුනු දේශපාලනික විරුද්ධ පාර්ශ්වය යි. ට්‍රොට්ස්කි 1937 මාර්තුවෙහි මෙසේ සඳහන් කලේ යඃ 'ලේවැකි හොර නඩු ඇටවීමේ සූදානමෙහි කලල අවස්ථාව පැවතියේ "කුඩා" ඓතිහාසික විකෘත කිරීම් තුල හා උපුටා දැක්වීම්වල "නිර්දෝෂී" විකෘත කිරීම් තුල ය,[9] යන්න අවිවාදාත්මක ඓතිහාසික සත්‍යයක් වෙයි.'

ස්ටැලින්වාදී භීෂනයෙහි සම්භවයන් අධ්‍යයනය කල, එහි ප්‍රතිඵල බැරෑරුම් ලෙස සලකා බැලූ, කිසි ම කෙනෙකු ඓතිහාසික විකෘත කරනයන්හි ප්‍රතිගාමී හා සමාජමය වශයෙන් විනාශකාරී භාවය අඩුවෙන් තක්සේරු නො කරනු ඇත. රුසියානු විප්ලවයේ ඉතිහාසය විකෘත කිරීම හැටියට පලමුවෙන් හිස එසවූ දේශපාලනික ප්‍රවනතාව යථා කාලයෙහි රුසියානු විප්ලවවාදීන් මහාපරිමානයෙන් ඝාතනය කිරීම බවට වර්ධනය වූ වග අපි සෝවියට් සංගමයේ නිදර්ශනයෙන් දැන ගෙන සිටිමු. අධමතම මිනීමරුවන්ගෙන් කෙනෙකු හැටියට ඉතිහාස ගත වීමට පූර්වයෙන් ම ස්ටැලින් ඉතිහාසයෙහි දැවැන්තම බොරුකාරයා හැටියට තම චරිතය පලිප්පු ගන්වා ගෙන සිටියේ ය.

ට්‍රොට්ස්කි හුදෙක් ස්ටැලින්ගේ මුසාවාද එලිදරව් කෙරුවා පමනක් නො වේ; ඔහු ස්ටැලින්ගේ පාලන තන්ත්‍රයෙහි දේශපාලනික හා සමාජමය වංචනික භාවයේ පුලුල් පද්ධතියෙහි වෛෂයික මූලයන් හා ක්‍රියාකාරිත්වය ද පැහැදිලි කලේ යඃ

> "සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ දහස්ගනන් ලේඛකයන් ඉතිහාසඥයන් හා ආර්ථික විද්‍යාඥයන් තමන් විශ්වාස නො කරන දේ අනාඥා පරිදි ලියති. විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්ට හා පාසල් ගුරුවරුන්ට නිර්දිෂ්ට පොතපත නිල මුසාවාදයේ ඊලඟ අදියරට ගැලපෙන ලරිද්දෙන් කඩිමුඩියේ වෙනස් කිරීමට බල කෙරේ. ධර්මාධිකරනයක ස්වභාවය රටෙහි වාතාවරනය සහමුලින්ම විනිවිද ගොස් ඇත්තේ, ගැඹුරු සමාජමය මූලාශ්‍රයන් ගෙන් පෝෂනය වෙයි. තමන්ගේ වරප්‍රසාද යුක්ති යුක්ත කරනු පිනිස පාලක කල්ලිය සියලු වරප්‍රසාද තුරන් කර ලීම අරමුන කර ගත් න්‍යාය විකෘත කරයි. ඒ අනුව මුසාවාදය, නිලධරයේ මූලික දෘෂ්ටිවාදීමය සිමෙන්තිය හැටියට ක්‍රියාත්මක වෙයි. නිලධරය හා ජනතාව අතර පරස්පර විරෝධය සමහන් කිරීම වඩවඩා දුෂ්කර වත් ම මුසාවාදය වඩවඩා රලුපරලු වෙයි; මුසාවාදය සාපරාධී විකෘතකරනයක් හා නීතිමය හොර නඩු ඇටවීමක් බවට නඟන ලෙස පරිවර්තනය කෙරේ. ස්ටැලින්වාදී පාලනයේ මෙම අභ්‍යන්තරික අපෝහකය වටහා නොගත් කෙනෙකු වෙත් නම් ඒ අනුව ම ඔහු මොස්කව් හොර නඩු වටහා ගැනුමටත් අපොහොසත් වෙයි."[10]

ස්ටැලින්වාදී නඩුකාරයා වන විෂින්ස්කි විසින්, මොස්කව් නඩු විභාගවල දී පැරනි බොල්ෂෙවික් විත්තිකරුවන්ට ගසා දමන ලද චෝදනා, යුක්ති සහගත කිරීමට පමනක් නොව සැබැවින්ම විශ්වාස කිරීමටත් තමන් වාමාංශික යැයි සලකා ගෙන සිටි එතරම් පිරිසක් සූදානම් වීම ආපසු හැරී බැලීමෙහි දී විස්මජනක කරුනක් සේ පෙනී යයි. ලිබරල්වාදී හා වාමාංශික මහජන මතයෙන් සැලකියයුතු කොටසක් මොස්කව් නඩු විභාග නීත්‍යානුකූල යැයි පිලගත්හ; එසේ පිලිගැනීම මගින් ඔවුහු සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුල බුරබුරා දැල්වුනු භීෂනයට පිටුබලය සැපයූහ. ස්ටැලින්වාදී පාලනය - සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුල එහි අපරාධ කෙබඳු වුවත් - අඩු ගනනේ 1939 අගෝස්තුවෙහි හිට්ලර් සමග සාම ගිවිසුම අත්සන් කරන තුරු ම නාසි ජර්මනියට විරුද්ධ මිතුරකු හැටියට සලකනු ලැබුනි. සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ සුලුධනේශ්වර 'මිතුරන්ගේ' සමාජ

දෘෂ්ටියෙහි මුල් බැසගෙන පවතින තත්කාර්යවාදී සලකා බැලීම් 'වාමාංශික' මහජන මතයේ විශාල කොටසක ස්ටැලින් ගැති ක්ෂමාලාප යටින් පැවතියේ ය. චෝදනාවල මූලික අංග ප්‍රතික්ෂේප කිරීම පවා ස්ටැලින්වාදී ක්ෂමාලාපකයන් විසින් මග හරිනු ලැබුනි.[11] ඩේවි කොමිසමට එම නම ලැබුනේ, ලියොන් ට්‍රොට්ස්කිට එරෙහි සෝවියට් චෝදනාවල 1937 පරීක්ෂනයෙහි සභාපති හැටියට කටයුතු කල ඇමරිකානු ලිබරල් දාර්ශනිකයාගේ නමෙනි. ඩේවි කොමිසමේ වැඩ කටයුතු විශේෂයෙන් ම බ්‍රිතාන්‍යයේ ප්‍රන්සයේ හා එක්සත් ජනපදයෙහි වාම කවයන්හි බල පැවැත්වූ නරුම, වංචනික හා ප්‍රතිගාමී ආකල්පවලට එරෙහි ව උදාර ප්‍රතිරෝධයක් දැක්විය.

## ස්ටැලින්වාදය එළිදරව් කිරීම

මොස්කව් නඩු විභාගවල දී ගොඩනැංවුනු මුසාවාද කන්දරාව කුඩුපට්ටම් ව යාම ආරම්භ වීමට තවත් දශක දෙකක් පමන ගත වීමට තිබුනි. මෙම සන්තතියෙහි තීරනාත්මක සිදු වීම වූයේ 1956 පෙබරවාරියේ දී සෝවියට් සංගමයෙහි කොමියුනිස්ට් පක්ෂයේ 20 වන සමුලුවෙහි දී කෘෂේව් කල රහසිගත කතාව යි. ස්ටැලින්ගේ භීෂනයෙහි සාපරාධී ස්වභාවය එහි දී ප්‍රථම වතාවට පිලිගනු ලැබිනි. එහෙත් මෙම එළිදරව් කිරීමට පූර්වයෙන් ඓතිහාසික පරීක්ෂනයන් පිලිබඳ ක්ෂේත්‍රයෙහි වැදගත් වර්ධනයක් සිදු විය. මෙම වර්ධනයන් සෝවියට් සංගමයේ ඉතිහාසයත් ලියොන් ට්‍රොට්ස්කිගේ කාර්ය භාරයත් පිලිබඳ ව කරුනු අතින් නිරවද්‍ය වූ ද වඩා ගැඹුරු වූ ද වැටහීමකට අප්‍රමාන ප්‍රතිපදානයක් කලේ ය.

ට්‍රොට්ස්කි ඓතිහාසික ව පුනස්ථාපනය කිරීමේ ප්‍රථම ප්‍රමුඛ සිද්ධිය වූයේ සෝවියට් රුසියාව පිලිබඳ ඊ.එච්. කාර් විසින් රචිත දෘවැන්ත ඉතිහාසය විශේෂයෙන් ම එහි හතර වන වෙලුම වූ 'ද ඉන්ටරෙග්නම්' (*The Interregnum*) ප්‍රකාශයට පත් කිරීම යි. මෙම වෙලුම, සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය තුල 1923-24 අතරෙහි පුපුරා ගිය දේශපාලනික අරගල පිලිබඳ ව විස්තරාත්මක ලේඛනයක් ඉදිරිපත් කලේ ය. ඒ සඳහා බටහිර ලෝකයෙන් ලබා ගත හැකි වූ නිල සෝවියට් වාර්තා පෘථුල ලෙස උපයෝග කර ගන්නා ලදී. කාර් දේශපාලනික වශයෙන් ට්‍රොට්ස්කි හා සහානුභූතික නො වීය. සෝවියට් ඉතිහාසයේ දුෂ්කර හා තීරනාත්මක කාල පරිච්ඡේදයක, ක්‍රියා මාර්ග, පිලිවෙත් හා මූලධර්ම පිලිබඳ ව ට්‍රොට්ස්කි විසඳාලීමට යත්න දරූ සංකීර්න ප්‍රශ්නන, කාර් දීප්තිමත් ලෙස සංක්ෂිප්ත හා විශ්ලේෂනය කොට දක්විය. ආරම්භක අදියරයන්හි දී ට්‍රොට්ස්කිගේ සතුරන් තුල පුද්ගල බලය සම්බන්ධිත ව පැන නැගුනු මනෝමූලික සලකා බැලීම් විසින් මෙහෙයවනු ලැබුනු මූලධර්ම විරහිත ප්‍රහාරයක ගොදුර බවට ට්‍රොට්ස්කි පත් වූ වග කාර්ගේ විශ්ලේෂනයෙන් පැහැදිලි විය. ස්ටැලින්, සිනොවියෙව් හා කමනෙව්ගේ ප්‍රකෝපකාරීත්වයන්ට ට්‍රොට්ස්කි දැක්වූ ප්‍රතිචාරය, කාර්ගේ විවේචනයන්ට බෙහෙවින් පාත්‍ර විය. එහෙත් ලෙනින්ගේ පසෙකින් රුසියානු විප්ලවයේ දෘවැන්ත රූපකාය හැටියට ට්‍රොට්ස්කි සිටියේ යැ යි තමන් විසින් සැලකුනු බවට කිසිදු සැකයක් ඉතිහාසඥයා ශේෂ නො කලේ ය. පසු කලෙක ලියූ වෙලුමක කාර් සඳහන් කලේ විප්ලවීය දේශපාලනික ක්‍රියාකාරිත්වයේ බොහෝ ක්ෂේත්‍රවල ට්‍රොට්ස්කි ලෙනින්ටත් වඩා බැබලුනු වග ය. ස්ටැලින් සම්බන්ධිත ව කාර් කියා සිටියේ ට්‍රොට්ස්කි සෑම අතින් ම ස්ටැලින් 'අතික්‍රමනය' කල වග ය. එහෙත් සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුල විප්ලවීය උද්ගතයෙහි බැස යාම - මෙය 1922න් පසු ව වඩාත් පැහැදිලි වන්නට විය - ට්‍රොට්ස්කිගේ දේශපාලනික අනාගතයට බල පෑවේ ය. කාර් මෙසේ ලිව්වේ ය; 'ට්‍රොට්ස්කි විප්ලවයේ වීරයෙක් විය. වික්‍රමාන්විත යුගය නිම වීමත් සමග ඔහුත් බිඳ වැටුනේ ය.'[12]

සෝවියට් ඉතිහාසය අධ්‍යයනය කිරීමේ ඊලඟ වැදගත් සිද්ධිය වූයේ අයිසැක් ඩොයිෂ්චර්ගේ විනිශ්චය රූපී චරිතාපදාන ත්‍රිත්වය ප්‍රකාශයට පත් වීම යි. එනම්, *The Prophet Armed*, *The Prophet Unarmed*, iy *The Prophet Outcast*. අප්‍රේල් 2007 ඩොයිෂ්චර්ගේ උපතෙහි ශත සංවත්සරය යි. එහෙයින්, ඉතිහාසඥයෙකු සහ චරිතාපදාන රචකයකු හැටියට ඔහු අත්පත් කර ගත් ජයග්‍රහනයන්ට ගරු සම්මාන පිදීමට මෙය උචිත අවස්ථාවකි. මා මෙහි දී කතා කරනුයේ ඩොයිෂ්චර්ගේ දේශපාලනික විනිශ්චයන් බොහොමයකට, විශේෂයෙන් ම හතර වන ජාත්‍යන්තරය ගොඩනැගීමට ට්‍රොට්ස්කි ගත් තීන්දුව සම්බන්ධයෙන් ඩොයිෂ්චර්ගේ විනිශ්චයන්ට (ඩොයිෂ්චර් මෙයට විරෝධය පෑවේ ය) සපුරා ම විරුද්ධ වන තැනැත්තකු හැටියට ය. එසේ වෙතත් ඩොයිෂ්චර්ගේ කෘතීන්හි බල පෑම අධිතක්සේරු කිරීම අපහසු ය. තමන්ගේ කාර්යභාරය තොමස් කාලයිල්ගේ කාර්යභාරය හා සසැඳීමේ දී ඩොයිෂ්චර් උද්ධච්ඡයකු වූයේ නො වේ. තොමස් කාලයිල් වනාහි තවත් විප්ලවවාදියකු වූ ඔලිවර් ක්‍රොම්වෙල්ගේ චරිතාපදාන රචකයා ය. කාලයිල්ට "සුන්බුන් කන්දරාවක් යටින් දෘවැන්ත මඩ ගැසීම් ගොන්නක් යටින් අමතක භාවයේ අන්ධකාරයෙන් ක්‍රොම්වෙල් ගොඩ ගැනුමට සිදු විය."[13] ඩොයිෂ්චර් සාඩම්බර අයුරින් එක්තරා බ්‍රිතාන්‍ය විචාරකයකු උපුටා දක්වයි. එම විචාරකයා මෙසේ පැවසීය: චරිතාපදාන ත්‍රිත්වයේ පලමු වන කෘතිය " දශක තුනක ස්ටැලින්වාදී නින්දා අපහාස සුනුවිසුනු කොට දමයි."[14]

කාර්ගේ සහ ඩොයිෂ්චර්ගේ කාර්යභාරයට අමතර ව 1950 ගනන්වල 1960 ගනන්වල 1970 ගනන්වල ඉතිහාසඥයන්ගේ නව පරපුරක්, රුසියානු විප්ලවය, සෝවියට් සංගමයේ සම්භවයන් හා වර්ධනය, එහි නායක පුද්ගලයන්, පිලිබඳ අපගේ අවබෝධයට සැලකිය යුතු එකතු කිරීම් කලේ ය. ලියෝපෝල්ඩ් හයිම්සන්, සැමුවෙල් බැරන්, රොබට් ඩැනියෙල්ස්, ඇලෙක්සැන්ඩර් රබිනෝවිච්, රොබට් ටකර්, මෝෂේ ලෙවින්, මාසල් ලීබ්මන්, රිචඩ් ඩේ හා බරුච් නී-පාස් මෙහි දී ක්ෂනික ව ම මතකයට එයි. ඔවුන්ගේ කාර්යභාරයේ වටිනාකම පිලිගැනීමෙන්, ඔවුන්ගේ ශාස්ත්‍ර ඥානය අගය කිරීමෙන්, ඔවුන්ගේ විනිශ්චයන් හා නිගමනයන් සමග එකඟ වීමක් ඇඟවුම් නො කෙරේ; එසේ එකඟ වීමක් අවශ්‍ය ද නො වේ. ඔවුන්ගේ ද මවිසින් නම් නො කෙරුනු අන්‍යයන්ගේ ද සාමූහික ප්‍රයත්නයන්හි සනාථන අදාලත්වය රුසියානු විප්ලවය හා සෝවියට් සංගමය පිලිබඳ ඉතිහාසය එතරම් දශක ගනනාවක් තිස්සේ වසා ගෙන සිටි මුසාවාද, විකෘත කිරීම් හා අර්ධ සත්‍යයන් නිෂ්ප්‍රභ කිරීමට ඒවා මගින් ප්‍රතිපදානයක් සිදු වීම යි. සෝවියට් ආන්ඩුවෙහි විකෘත කරනයන් පමනක් නො ව, සීතල යුද්ධය සමයෙහි එක්සත් ජනපද ආන්ඩුවෙහි සනී භවනය වන සුලු ප්‍රති මාක්ස්වාදී ප්‍රචාරයන් ද එමගින් නිෂ්ප්‍රභ කෙරුනි.

ඔවුන්ගේ කාලයෙහි බුද්ධිමය වාතාවරනය කෙරෙහි මෙම ඉතිහාසඥයන්ගේ කාර්යභාරය විසින් ඇති කෙරුනු බලපෑම පිලිබඳ ව හැඟීමක් ඇති කර ගැනුමට ට්‍රොට්ස්කිගේ ජීවිතය පිලිබඳ ව කෙරුනු අධ්‍යයනයකින් ඡේද කිහිපයක් උපුටා දැක්වීමට අවසර දෙන්න. එම අධ්‍යයනය ප්‍රකාශයට පත් කෙරුනේ 1973හි දී 'ග්‍රේට් ලයිව්ස් ඔබ්සර්ව්ඩ්' යන සුප්‍රකට ග්‍රන්ථ මාලාවෙහි කොටසක් හැටියට ය. මෙම ග්‍රන්ථ මාලාව ප්‍රකාශයට පත් කෙරුනේ අධ්‍යාපනික පාඨ ග්‍රන්ථ බෙදා හරින්නකු ලෙස චිර ස්ථාපිත ප්‍රෙන්ටිස් හෝල් නමැත්තා විසිනි. මෙම ග්‍රන්ථ මාලාව 1960 ගනන්වල හා 1970 ගනන්වල විශ්වවිද්‍යාල පාඨ මාලාවන්හි මුරගලක් විය. රුසියානු හෝ නූතන යුරෝපීය ඉතිහාසය පිලිබඳ පාඨමාලා හැදෑරූ දහස් ගනන් සිසුන් හට මෙම වෙලුම මගින් ලියොන් ට්‍රොට්ස්කිගේ ජීවන චරිතය ප්‍රථම වරට සම්මුඛ කෙරෙන්නට ඇත. ඒ අනුව එම වෙලුමෙහි ප්‍රථම ඡේදයෙන් ම ඔවුන් කියවන්නට ඇත්තේ මෙවැන්නකිඃ

> "කාලය ගත වීමත් සමග ඓතිහාසික පුද්ගල චරිත එක්කෝ හැකිලෙයි; නැතහොත් මහිමාවෙන් වැඩෙයි. ලියොන් ට්‍රොට්ස්කි සම්බන්ධයෙන් ගත් කල්හි, කාලය කෙටි අඳුරු කාල පරිච්ඡේදයකට පසු ව, ඔහුගේ රූප කාය කොතරම් උද්දීප්තියකට පත් කර තිබේ ද කිවහොත් හොඳට හෝ නරකට වේවා අද දිනයෙහි ඔහු පෙනී යන්නේ, විසි වන සිය වසෙහි ප්‍රථම භාගයේ යෝධයන්ගෙන් කෙනෙකු හැටියට ය. දූන් දැන් ට්‍රොට්ස්කි පිලිබඳ ව පල වන විවිධ අධ්‍යයනයන්ගෙන් ද එසේ ම ට්‍රොට්ස්කිගේ කෘතීන් ලබා ගැනුමට ඇති වී තිබෙන ක්ෂනික හැකියාවෙන් ද ට්‍රොට්ස්කිගේ ජීවිතය පිලිබඳ ව ඇති වී තිබෙන අභිනව උද්යෝගය පිලිබිඹු වෙයි. නව වාම පරම්පරාවෙහි බොහෝ දෙනෙකු හමුවෙහි ට්‍රොට්ස්කි විප්ලවවාදී නායකයා යනුවෙන් කීර්තියක් හා ගෞරව නාමයක් අත්පත් කර ගෙන සිටී."[15]

හැඳින්වීම මගින් සමකාලීන ශාස්ත්‍රඥයන්ගේ සොයා ගැනීම් මත පාදක ව ට්‍රොට්ස්කිගේ විප්ලවීය ජීවන වෘත්තිය පිලිබඳ ව සංක්ෂිප්ත ඇගයීමක් ඉදිරිපත් කෙරේ. "වැදගත් පුද්ගලයකු හැටියට පෙනී සිටීමට ට්‍රොට්ස්කිට පවතින අයිතිය" රඳා පවත්නේ " දේශපාලනික න්‍යායට ඔහු කල ප්‍රතිපදානය, ඔහුගේ සාහිත්‍යමය උරුමය හා අන් සියල්ලට මත් වඩා ක්‍රියා කාරී මිනිසකු හැටියට ඔහුගේ කාර්ය භාරය මත ය." ට්‍රොට්ස්කි න්‍යායාචාර්යවරයකු හැටියට රුසියානු සමාජ බලවේග පිලිබඳ ව කල විශ්ලේෂනය, නො නවතින විප්ලව න්‍යාය පිලිබඳ ව ඔහු කල විස්තාරනය "විසින් ඇඟවුම් කෙරෙනුයේ, ඔහුට මාක්ස්වාදී චින්තකයකු හැටියට පැවති නිර්මානශීලීත්වයේ බලයෙන් මාක්ස්ගේ හා එංගල්ස්ගේ සූත්‍ර ගත කිරීම් ඉක්මවා යාමට පුලුවන්කම පැවති බව ය." ඒ අනුව ට්‍රොට්ස්කි, " දීප්තිමත් මාක්ස්වාදී න්‍යායධරයන් වූ ප්ලෙකානොව්, කවුට්ස්කි, ලක්සම්බර්ග්, වැඩි දුරටත් පවසනවා නම් ලෙනින් වැන්වුන්" අතරෙහි තැනක් ලැබීමට සුදුස්සෙක් වන්නේ ය. සාහිත්‍යමය රචකයෙකු හැටියට ට්‍රොට්ස්කි, මෙම ශ්‍රේෂ්ඨ මාක්සවාදීන් හට ද ඉහලින් සිටියේ ය. " උත්කෘෂ්ට වචන පරිහරනය කැපෙනසුලු උපහාසය හා දීප්තිමත් චරිත සටහන් ඔහුගේ ලේඛනයෙහි ප්‍රමුඛ අංග වෙයි. ට්‍රොට්ස්කි කියවීම සාහිත්‍යමය කලාකරුවා වැඩෙහි නිරත වන අයුරු නිරීක්ෂනය කිරීමක් වෙයි." අනතුරුව ක්‍රියාකාරී මිනිසකු හැටියට ට්‍රොට්ස්කි විසින් අත්පත් කර ගැනුනු ජයග්‍රහන වෙයි. හැඳින්වීමෙහි මෙසේ සඳහන් වෙයි. "රුසියානු විප්ලවීය ඉතිහාසයෙහි ට්‍රොට්ස්කිගේ කාර්ය භාරය දෙවන වනුයේ ලෙනින්ගේ කාර්ය භාරයට පමනි." "මිලිටරි විප්ලවවාදී කමිටුවෙහි ඔහුගේ තීරනාත්මක නායකත්වය ඔක්තෝබර් නැගිටීමට මාවත පෑදුවේ ය...." හැඳින්වීම, "දූවැන්ත බාධක හමුවෙහි රතු හමුදාව ගොඩනැංවීමට ට්‍රොට්ස්කිගේ අධිෂ්ඨාන සහගත ප්‍රයත්නය වෙත ද අවධානය කැඳවයි..."[16]

මෙම ජයග්‍රහන කිසිවක් ගැන සෝවියට් පුරවැසි ජනතාව දූන සිටියේ නැත. සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුල, ට්‍රොට්ස්කිගේ

ජීවිතය හා කාර්ය භාරය පිලිබඳ ව කිසිදු අවංක සටහනක් නො වීය. ඊට හේතුව "සෝවියට් ඉතිහාසඥයන් බොහෝ කලකට පෙර සිට ම ඓතිහාසික ලේඛනයෙහි වගකීම අත් හැර දමා තිබීම යි. ඒ වෙනුවට ඔවුන් යුහුසුලු ව නිරත වී සිටියේ නව රාක්ෂසවේදයක් නිර්මානය කිරීමේ විරූපී උත්සාහයක ය." සෝවියට් සංගමය තුල ට්‍රොට්ස්කි "දුෂ්ටත්වයේ වියුක්තනයක්, සෝවියට් ජනතාවගේ අනාගතයට එරෙහි ව කැරලි ගසන සටන්කාමී බල වේගයක් බවට පත් කෙරී තිබින."[116]

. එම.

[7] එහෙත් සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයෙන් පිටත තත්වය වෙනස් විය:

> "සෝවියට් රාක්ෂසවේදය එහි පිලිසිඳ ගැනුමෙහි පටන් ම අභූතයක් වූයේ අඩු ගනනේ බටහිර ලෝකය තුල බොහෝ දුරට ම පරාජයට පත් කෙරී ඇත. මෙම කෘතියෙහි තෙවන කොටසෙහි ට්‍රොට්ස්කි පිලිබඳ ගැටලුව සම්බන්ධයෙන් වඩාත් මෑත කාලීන ලේඛකයන්ගේ රචනාවන්ගෙන් උපුටා ගත් කොටස් අන්තර්ගත වෙයි. මෙම වඩාත් වෛෂයික වූ අධ්‍යයනය පිලිබඳව ඉතා ම හොඳ නිදසුන් වනුයේ එඩ්වඩ් හැලට් කාර්ගේ බොල්ෂෙවික් විප්ලවය නමැති වෙලුම් ගනනාවකින් යුත් අධ්‍යයනයත් අයිසැක් ඩොයිෂ්චර්ගේ වෙහෙස මහන්සි වී රචිත ට්‍රොට්ස්කි පිලිබඳ වෙලුම් තුනකින් යුත් අධ්‍යයනය යි. ඓතිහාසික විවාදය අවසන් නො වන්නට පුලුවන; එහෙත් මෙම වඩාත් මෑත කාලීන අධ්‍යයනයන්ගේ ආලෝකයෙන් රුසියානු අත්දැකීමෙහි ට්‍රොට්ස්කිගේ කාර්ය භාරය නව හා සාධනක පර්යාලෝකයකින් දැක ගැනුමට පුලුවන් වන්නේ ය. බටහිර ලෝකය තුල දුර්ගන්ධිත වලාකුල අතුරුදහන්ව ගොස් ඇත; අරක් ගෙන සිටි රාක්ෂස ප්‍රභූ තන්ත්‍රය පලවා හරිනු ලැබ තිබේ. එහෙයින් දැන් අපට ලියොන් ට්‍රොට්ස්කිගේ ක්‍රියාකාරිත්වයන්ට හා කාර්යභාරයන්ට උද්වේගය හා ආවේගය සැපයූ භෞතික බලවේග හා ප්‍රශ්න අවබෝධ කර ගැනුමට පුලුවන්කම ලැබී ඇත."[118]

.

මා මෙහි දී මෙම කෘතියෙන් දීර්ඝ වශයෙන් උපුටා දැක්වූයේ මීට වසර 35කට පමන පෙර විශ්වවිද්‍යාල මට්ටමෙහි ඉතිහාසය විෂය හැදෑරූ සාමාන්‍ය ශිෂ්‍යයන්ට ලියෝන් ට්‍රොට්ස්කි පිලිබඳ ව උගන්වනු ලැබූ දෑයෙහි සාරාංශයක් එයින් ඉදිරිපත් කෙරෙන හෙයිනි.[19] වර්තමානයෙහි ශිෂ්‍යයන්හට ඉදිරිපත් කෙරෙන කෘතීන් වෙත නෙත් යොමු කල කල්හි ක්ෂනික ව ම පැහැදිලි වනුයේ අප දැන් ජීවත් වනුයේ ඊට බෙහෙවින් ම වෙනස් එතරම් සෞඛ්‍ය සම්පන්න නො වූ බුද්ධිමය පරිසරයක බව ය. මෙම කෘතීන් විභාග කිරීමට පූර්වයෙන් සංක්ෂිප්ත ව හෝ කල යුතු කටයුත්තක් ඇත; එනම් 20 වන සම්මේලනයට හා කෘෂෙව්ගේ 'රහසිගත කතාවට' පසු ව සෝවියට් ඓතිහාසික ලේඛනවල ලියොන් ට්‍රොට්ස්කි පිලිබඳ ව කර ඇති ප්‍රකාශ පිරික්සා බැලීම යි.

## 20 වන සම්මේලනයට පසු ව සෝවියට් ඉතිහාසය

1956හි දී ස්ටැලින්ගේ අපරාධ පිලිබඳ ව නිල එලිදරව් කිරීමෙන් අනතුරුව ක්‍රෙම්ලින් නිලධරයත් එහි බොහෝ වූ ක්ෂමාලාපකයෝත් තමතමන්ගේ නිරවද්‍ය තාවය තහවුරු කරන්නට පෙරට ආහ. දශක දෙකකට ආසන්න කාලයක් ඉතිහාසය පිලිබඳ ව පක්ෂයේ ආස්ථානය ව පැවතියේ ස්ටැලින්ගේ ම 'සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ ඉතිහාසය පිලිබඳ කෙටි පාඨ මාලාවක්' නමැති කෘතිය යි. විසි වන පක්ෂ සම්මේලනයේ වේදිකාවට කෘෂෙව් නැගුනු මොහොතෙහි පටන් රුධිරය වැකුනු මෙම ඇදහිය නොහෙන තරම් වන මුසාවාද කන්දරාවට පැවති විශ්වසනීයත්වය මුලුමනින් ම බිඳ වැටුනේ ය. එහෙත් ඊට විකල්ප වශයෙන් ඉදිරිපත් කල හැකි වූයේ කුමක් ද? මෙම ප්‍රශ්නයට විශ්වසනීය වූ පිලිතුරක් සොයා ගැනුමට ස්ටැලින්වාදී නිලධරයට කිසි ම කලෙක නුපුලුවන් විය.

රුසියානු විප්ලවීය ව්‍යාපාරයේ ඉතිහාසයට සම්බන්ධිත සෑම වැදගත් ප්‍රශ්නයක් ම - 1917 සිදුවීම්, සිවිල් යුද්ධය, සෝවියට් රාජ්‍යයේ මුල් වසර, 1920 ගනන්වල පක්ෂාභ්‍යන්තර ගැටුම්, සෝවියට් නිලධරයේ වර්ධනය, ජාත්‍යන්තර විප්ලවීය ව්‍යාපාර හා අරගල සමග සෝවියට් සංගමයේ සම්බන්ධතාව, කාර්මික කරනය, සාමූහික කරනය, සෝවියට් සංස්කෘතික පිලිවෙත, ස්ටැලින්වාදී භීෂනය, ලෙව් ඩේවිඩොවිච් ට්‍රොට්ස්කි පිලිබඳ කරුන කේන්ද්‍රස්ථානයට රැගෙන ආවේ ය. ස්ටැලින් පිලිබඳ සෑම විවේචනයක් විසින් ම ඉස්මතු කෙරුනු ප්‍රශ්නය ට්‍රොට්ස්කි නිවැරදි වී ද යන්න යි. ස්ටැලින්ගේ අපරාධ අනාවරනය කිරීමත් සෝවියට් සමාජයේ සෑම අංශයක් කෙරෙහි ම ඔහුගේ පිලිවෙත් හා පෞරුෂය මගින් ඇති කෙරුනු විනාශකාරී බලපෑමත් කෙරෙන් ගලා ආ ඓතිහාසික, දේශපාලනික, න්‍යායික හා සදාචාරාත්මක ප්‍රශ්න හුදෙක් ස්ටැලින්, ලෙනින් පසෙකින් වූ වීදුරුවලින් ආවරනය කෙරුනු සුසානඝරයෙන් ඉවත් කොට ක්‍රෙම්ලින් තාප්පය යට යලි වල දැමීමෙන් නිරාකරනය කරනු නො හැකි විය.

ස්ටැලින්වාදී නිලධරය අවසාන වශයෙන් අන්තිමේ දී ඉතිහාසය සමග ගනුදෙනු බේරා ගැනුමෙන් ලියොන් ට්‍රොට්ස්කි පිලිගැනුමටත් මාවතක් පාදා ගනු ඇතැයි යනුවෙන් අපේක්ෂාවක් අයිසැක් ඩොයිෂ්චර් තුල විය; මෙම අපේක්ෂාවෙන් ඔහුගේ දේශපාලනික දෘෂ්ටියේ සීමා සහිතකම පිලිබිඹු විය. ඩොයිෂ්චර්ගේ අපේක්ෂාව එල දැරුවේ නැත. ට්‍රොට්ස්කි සම්බන්ධයෙන් යුක්තිය ඉෂ්ට කිරීමට නම් කිසියම් අවස්ථාවක දී ඔහුගේ කෘතීන් එලිදැක්වීමක් අවශ්‍ය විය. දශක ගනන් ගත විය. ස්ටැලින්වාදී පාලනය පිලිබඳ ව ට්‍රොට්ස්කිගේ එලිදරව් කිරීම හා හෙලා දැකීම ට්‍රොට්ස්කි ජීවත් ව සිටි කාලයෙහි වූ පරිද්දෙන් ම විප්ලවීය ශක්‍යතාවෙන් පුපුරනසුලු වූයේ ම ය.

1985 දී ගොර්බචෙව් බලයට පැමින ඔහුගේ ග්ලැස්නොස්ට් ප්‍රතිපත්තිය එලිදරව් කිරීමත් සමග ම ට්‍රොට්ස්කි නිල වශයෙන් පුනස්ථාපනය කිරීම පිලිබඳ ව ප්‍රසිද්ධියේ කෙරෙන බොහෝ සාකච්ඡා ඇති විය. ඔක්තෝබර් විප්ලවයේ 70 වන සංවත්සරය එලඹෙද්දී, ඔක්තෝබර් විප්ලවයට නායකත්වය සැපයීමෙහි ලා ට්‍රොට්ස්කිගේ කාර්යභාරයක් ස්ටැලින්ට විරුද්ධ ව ඔහුගේ අරගලයත් පිලිගැනුමට ගොර්බචෙව් විසින් එම අවස්ථාව උපයෝගී කර ගනු ඇතැයි බෙහෝ දෙනෙක් අපේක්ෂා කලහ. එහෙත් සිදු වූයේ එහි ප්‍රතිපක්ෂය යි. 1987 නොවැම්බර් දෙවන දින රූපවාහිනියෙන් ජාතික ප්‍රේක්ෂක පිරිස අමතමින් ගොර්බචෙව් යලිත් වතාවක් සම්ප්‍රදායික ස්ටැලින්වාදී වගන්තිවලින් ට්‍රොට්ස්කි හෙලාදුටුවේ ය. ට්‍රොට්ස්කි 'සැමවිට ම ආස්ථානය වෙනස් කල, වංචනික ලෙස ක්‍රියා කල, සීමාන්තික ලෙස ආත්ම විශ්වාසයෙන් යුක්ත පුද්ගලයකු වී යැ'යි ගොර්බචෙව් ප්‍රකාශ කලේ ය.[2 20]

ගොර්බචෙව් ඔහුගේ නිර්ලජ්ජ කථාව කරන කාලය වන විට ට්‍රොට්ස්කි හා වාම විරුද්ධ පක්ෂයේ අරගලය පිලිබඳ ව උද්යෝගය සෝවියට් සංගමය තුල වේගයෙන් වර්ධනය වෙමින් පැවතියේ ය. 1920 ගනන්වලින් පසු ව ප්‍රථම වතාවට *Argumenti i Fakti* බඳු ට්‍රොට්ස්කි සම්බන්ධිත ලිපි ලේඛන කියවන පාඨක සංඛ්‍යාවෙහි දැවැන්ත වර්ධනයක් ඇති විය. යුරෝපයෙන්, ඕස්ට්‍රේලියාවෙන්, සහ එක්සත් ජනපදයෙන් ට්‍රොට්ස්කිවාදීහු සෝවියට් සංගමයට ගොස් පෘථුල ශ්‍රාවක සංඛ්‍යාවක් සහභාගි වූ දේශන පැවැත්වූහ. ගොර්බචෙව්ගේ කථාව පැහැදිලි ව ම මෙම වෙනස් වූ තත්වයට ප්‍රතිචාර දක්වීමට දැරුනු ප්‍රයත්නයක් විය. එහෙත් එය සහමුලින් ම අසාර්ථක වුනි. ඔක්තෝබර් විප්ලවය සම්බන්ධයෙන් ට්‍රොට්ස්කිගේ කාර්ය භාරය ප්‍රතික්ෂේප කරන ඔහු සෝවියට් සංගමයේ සතුරකු හැටියට නිරූපනය කරන පැරනි ස්ටැලින්වාදී මුසාවාදවල විශ්වසනීයත්වය සපුරා ම නැති වී ගොස් තිබුනි.

ගොර්බචෙව්ගේ කතාවෙන් වසර හතරකට යන්තම් වැඩි කාලයක් ගත වන විට සෝවියට් සංගමය නො පවතින තත්වයට පත් විය. ස්ටැලින්වාදී නිලධරය එය කම්කරු පන්තිය විසින් පෙරලා නො දැමුන හොත් අවසාන වශයෙන් සෝවියට් සංගමය විනාශ කොට ධනේශ්වර ක්‍රමය පුනස්ථාපනය කිරීමට මාවත පාදනු ඇතැයි යන ට්‍රොට්ස්කිගේ අනතුරු ඇඟවීම සනාථ විය.

**සටහන්**

[1] "සෝවියට් මර්දනය පිලිබඳ සංඛ්‍යා ලේඛනඃ සටහන් කිහිපයක්" යුරෝපය හා ආසියාව පිලිබඳ අධ්‍යයන, වෙලුම 54, නො.7 (නොවැම්බර් 2002) පි. 116.

[2]. අධ්‍යාපන ආයතනයෙහි කටයුතු සම්බන්ධිත කරුනු පාදක කෙරී ඇත්තේ මාක් ජෙන්සන් සහ නිකිතා පෙට්‍රෝව් විසින් රචිත "මහජන ත්‍රස්තය හා අධිකරනයඃ සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ මිලිටරි අධ්‍යාපන ආයතනය" යුරෝපය හා ආසියාව පිලිබඳ අධ්‍යයන, වෙලුම 58, නො.4, ජූනි 2006, පි.589-602.

[3]. එම, පි. 591.

[4]. එම.

[5] එම, 593 පි.

[6] එම, 595 පි.

[7] එම, 596 පි.

[8] 1937ඃ ස්ටැලින්ගේ ත්‍රස්තය පිලිබඳ වසර (ඕක් පාක්, 1998) පි. xii-xiii.

[9] විකෘති කරනයේ ස්ටැලින්වාදී ගුරු කුලය (ලන්ඩන්, 1974) පි. ix.

[10] එම, පි. xiii

[11] නිදර්ශන වශයෙන් ප්‍රථම මොස්කව් නඩු විභාගයෙහි දී හොල්ට්ස්මන් මෙසේ සාක්ෂ්‍ය දුන්නේ ය. 1932 දී ඔහු ....... කෙනෙකු හැටියට කෝපන්හේගන්වලට යවනු ලැබ ඇත. එහි බ්‍රිස්ටල් හෝටලයෙහි දී ඔහුට ට්‍රොට්ස්කිගේ පුත් ලියොන් සෙඩොව් මුනගැසී තිබේ. සෙඩොව්ගෙන් ඔහුට සෝවියට් විරෝධී නියෝග ලැබී ඇත. කෝපන්හේගන්හි බ්‍රිස්ටල් හෝටලය ඊට වසර පහලොවකට පෙර, 1917හි දී ගිනිබත් ව ඇති බව ඉක්මනින් ම එලිදරව් විය. එම වැදගත් කුමන්ත්‍රනකාරී රැස්වීම ඇති වන්නට පුලුවන්කමක් නොමැත. දෙවන නඩු විභාගයෙහි දී පැරනි බොල්ෂෙවිකයෙකු වන වාම විරුද්ධ පාක්ෂික යූරි පියටකෝව් සාක්ෂ්‍ය දෙමින් කියා සිටියේ 1935 දෙසැම්බරයෙහි දී සෝවියට් කටයුත්තක් සඳහා බර්ලිනයට ගොස් සිටිය දී තමන් රහසිගත ව ඔස්ලෝ බලා ගුවන් ගත වූ බව ය. එතැනින් තමන් ට්‍රොට්ස්කිගේ නිවසට කැඳවා ගෙන යනු ලැබූ බව පියටකෝව් පැවසීය. එතැන්හිදී පියටකෝව්ට - ඔහු මෙවිට එන්කේවීඩී ප්‍රශ්න කරන්නන් විසින් ලියා දෙන ලද ලේඛනයක් කියවීය - ට්‍රොට්ස්කි දැනුම් දුන්නේ තමන්ට නාසි ජර්මනියේ ඒජන්ත සංවිධාන සමග සම්බන්ධතා පවතින බව ය. තමන් ට්‍රොට්ස්කිගේ සෝවියට් විරෝධී නාසි ගැති කුමන්ත්‍රනයට සම්බන්ධ වූ වගට පියටකෝව් අනතුරුව පාපොච්චාරනය කලේ ය. එහෙත් නඩු විභාගය අවසන් වන්නටත් පූර්වයෙන් ම

පියටකෝව්ගේ සාක්ෂ්‍යය කැබලිවලට පුපුරා ගියේ ය. 1935 සැප්තැම්බරයේ සිට 1936 මැයි දක්වා කාලයේ දී ඔස්ලෝ ගුවන් තොටුපලට කිසිදු විදේශීය ගුවන් යානයක් නොපැමිනි බව නෝර්වීජියානු පුවත්පත් විසින් වාර්තා කෙරින! මුලු මහත් ස්ටැලින්වාදී නඩු ඇටවීම පරම වසයෙන් පියටකොව්ගේ කතාව නරුම බොරු ගෙතිල්ලක් හැටියට එලිදරව් කෙරින.

[12]. තනි රටේ සමාජවාදය, වෙලුම 1 (නිව් යෝක්, 1958), පි.152.

[13]. ද ප්‍රොෆට් අන්ආම්ඩ් (ලන්ඩන්, 1957), පි. v.

[14] .එම.

[15] ට්‍රොට්ස්කි (එංගල්වුඩ් ක්ලිෆ්ස්, එන්ජේ 1973) පි. 1.

[16]. එම.

[17]. එම. පි. 1-2

[17]. එම.

[19]. ශාස්ත්‍රීය සඟරාවක් විසින් මෙම වෙලුම පිලිබඳ ව කරන ලද විවරනය එහි ප්‍රේක්ෂකයන්ගේ මෙම ඇගයීම සනාථ කරයි: "උගැන්වීම හා පන්ති කාමර භාවිතය සම්බන්ධයෙන් මෙම සංස්කරනයට සැලකිය යුතු පිලිගැනීමක් තිබිය යුතු ය. මෙම ග්‍රන්ථ මාලාවෙහි සෙසු කෘතීන් මෙන් මෙම කෘතිය එහි විස්තෘත පුද්ගලයාගේ දාර්ශනික හා දේශපාලනික ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලද අනුමාන උද්ධෘත සමුදායක් තුල පාඨකයන් අතරමං කරන්නේ නැත. එය ට්‍රොට්ස්කිගේ ජයග්‍රහන මැනවින් විස්තර කරයි; ඔහුගේ වෘත්තිමය ජීවිතය පිලිබඳ එකිනෙකට වෙනස් ඓතිහාසික නිර්වචන පාඨකයා හමුවෙහි තබයි.

"මොනයම් රුසියානු පාඨමාලාවක වුව හොඳ ගුරුවරයෙකුට වුව මෙම ග්‍රන්ථය ඵලදායී ලෙස උපයෝග කර ගැනුමට පුලුවන. ඔහුට එසේ කල හැකි වනුයේ, කර්තෘවරයාගේ සම්පූර්න ප්‍රවාද වැඩි දුරටත් පිරික්සනු වස් සාපේක්ෂ වශයෙන් කෙටි තෝරා ගැනීම් දොරටු හැටියට ප්‍රයෝජනයට ගැනීමෙනි. සාමාන්‍ය ශිෂ්‍යයෙකු කෘතියේ සංක්ෂිප්ත භාවය අගයනු ඇත; පිටු 170ක් පමනි. කෙසේ වෙතත් වඩාත් වැදගත් වනුයේ රුසියානු ඉතිහාසයේ සැබෑ ශිෂ්‍යයන් හට එයින් අත්පත් කර ගත හැකි වන ප්‍රයෝජනය යි. අන්තර්ගතය විසින් උද්යෝගිමත් කරනු ලැබෙනුයේ එහෙත් සංක්ෂිප්ත භාවය නිසා හටගත් කනස්සල්ලෙන් යුක්ත වූයේ

ඔහු ලියොන් ට්‍රොට්ස්කි පිලිබඳව පවත්නා නියම දින පොත්, ආත්ම චරිත හා ජීවන චරිත වඩාත් ගැඹුරින් අධ්‍යයනය කිරීමට යොමු වනු ඇත. මෙම ග්‍රන්ථ මාලාවෙහි සංස්කරනය කරන ලද මොනයම් ග්‍රන්ථයක වුව සාර්ථකත්වය මැන බැලිය යුත්තේ එසේ කිරීමට යොමු වන ශිෂ්‍යයන් සංඛ්‍යාවෙනි." වෙලුම 7 නො.2 (පෙබරවාරි 1974) පි. 291-92

20 එපමනක් නොවේ. ගොර්බචෙව් තව දුරටත් මෙසේ ද පැවසී ය: "ධනේශ්වර ක්‍රමය විසින් වට කරනු ලැබූ කොන්දේසි සමාජවාදය ගොඩනැගීමට පවතින හැකියාව ට්‍රොට්ස්කි හා ට්‍රොට්ස්කිවාදීන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබින. විදේශ ප්‍රතිපත්තියෙහි ලා ඔව්හු විප්ලවය අපනයනය කිරීමට ප්‍රමුඛත්වය දුන්හ. දේශීය ප්‍රතිපත්තියෙහි ලා ඔව්හු ගොවි ජනතාව මත, නගරය විසින් ගම සූරා කනු ලැබීම මත සමාජය පරිපාලනය කිරීමෙහි ලා පරිපාලනමය හා මිලිටරිමය ක්‍රියාකලාපයන් මත ඇන තද කිරීමට ප්‍රමුඛත්වය දුන්හ.

"ට්‍රොට්ස්කිවාදයේ දෘෂ්ටිවාදීහු ව්‍යාජ වාම විප්ලවවාදී තර්ක විතර්ක පිටුපස සැඟවී සිටියහ. එහෙත් සැබවින් ම ඔවුහු පරාජකවාදී ආස්ථානයක පිහිටියහ. ට්‍රොට්ස්කිවාදය මෙබඳු දේශපාලනික ප්‍රවනතාවක් විය. සාරාර්ථ වශයෙන් ගත් කල්හි එය හිස සිට පාදාන්තය දක්වා ම ලෙනින්වාදයට එල්ල කරන ලද ප්‍රහාරයක් විය. ප්‍රායෝගික වශයෙන් ගත් කල්හි එය අප රට තුල සමාජවාදයේ අනාගත විප්ලවයේ ඉරනම පිලිබඳ ප්‍රශ්නයක් විය.

"මෙම කොන්දේසි තුල මුලු මහත් ජනතාව ඉදිරියේ ට්‍රොට්ස්කිවාදය බිඳ හෙලීමත් එහි සමාජවාද විරෝධී සාරය පෙන්නුම් කිරීමත් අත්‍යවශ්‍ය විය. ග්‍රිගෝරි සිනොවියෙව් හා ලිව් කමනෙව් විසින් නායකත්වය දෙනු ලැබුනු නව විරුද්ධ පාර්ශ්වය හා ට්‍රොට්ස්කිවාදීන් පොදුවේ ක්‍රියා කරමින් සිටීම නිසා තත්වය සංකීර්න විය. තමන් සුලුතරයක් බව දන සිටි හෙයින් වාමාංශයේ සාකච්ඡා මගින් පක්ෂය මත යලිත් බර පැටවූයේ එහි සේනාංකවල භේදයක් අපේක්ෂා කරමිනි.

"එහෙත් අවසාන විග්‍රහයේ දී පක්ෂය මධ්‍යම කාරක සභාවේ ආස්ථානයට පක්ෂ වත් විරුද්ධ පාර්ශ්වයට එරෙහි වත් පෙල ගැසුනාහ. විරුද්ධ පාර්ශ්වය ඉක්මනින් ම දෘෂ්ටිවාදීමය වශයෙන් හා සංවිධානාත්මක වශයෙන් කුඩුපට්ටම් කරනු ලැබුනි.

"කෙටියෙන් පැවසුවොත් ජෝසප් ස්ටැලින් විසින් නායකත්වය දෙනු ලැබූ පක්ෂයේ නායක න්‍යෂ්ටිය දෘෂ්ටිවාදීමය අරගලයක දී ලෙනින්වාදය ආරක්ෂා කලේ ය. එය සමාජවාදය ගොඩනැගීමේ ආරම්භක අදියරෙහි මූලෝපාය හා උප උපායන් නිර්වචනය කලේ ය. පක්ෂයේ බොහෝ සාමාජිකයෝ ද වැඩ කරන ජනතාවෝ බොහොමයක් ද එහි දේශපාලනික මාවත අනුමත කලහ. ට්‍රොට්ස්කිවාදය දෘෂ්ටිවාදීමය වසයෙන් පරාජය කිරීමෙහි ලා වැදගත් කාර්ය භාරයක් නිකොලායි බුකාරින්, ෆීලික්ස් සර්ෂින්ස්කි, සර්ගෙයි කිරොව්, ග්‍රිගෝරි ඔඩ්ෂොනිකිඩ්සෙ, ජැන් රුඩ්සුටැක් සහ සෙසු අය විසින් ඉෂ්ට කරනු ලැබුනි." (ද නිව් යෝක් ටයිම්ස්, නොවැම්බර් 3, 1987)